# ව්‍යාපාරික පරිසරය තුල ප්‍රධාන වැරදි සහ නව රෙගුලාසි
## 10 පාඩම ( ලකුණු 12 % )

1.1) මුදල් විශුද්ධිකරණය යනු කුමක්ද ?
මුදල් විශුද්ධිකරණය යනු නීතිවිරෝධී ක්‍රියාකාරකම් වලින් උපයා ගන්නා ලද මුදල් එහි මූලාශ්‍රය ( එය උපයා ගත් ක්‍රමය ) නීතියට වසන් කිරීමේ අරමුණෙන් විධිමත් මූල්‍ය සංසරණ පද්ධතියට ඇතුල් කිරීම සඳහා යොදා ගන්නා ලබන වංචාකාරී ක්‍රමවේදයයි.

1.2) මුදල් විශුද්ධිකරණයට අදාල නීතිවිරෝධී ක්‍රියාකාරකම් මොනවාද ?
මත්ද්‍රව්‍ය ජාවාරම, ත්‍රස්තවාදය සඳහා මුදල් රැස්කිරීම, ළමුන්ට එරෙහි වැරදි සහ පුද්ගලයන් ජාවාරම් කිරීම, සයිබර් අපරාධ, නීතිවිරෝධී ලෙස අවිආයුධ ජාවාරම, අල්ලස් ගැනීම, විනිමය පාලන නීති උල්ලංගනය කිරීම

1.3) 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ අරමුණු මොනවාද ?
- ශ්‍රී ලංකාවේ මුදල් විශද්ධිකරණය තහනම් කිරීම
- මුදල් විශුද්ධිකරණය මර්දනය පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිම

1.4) එම පනත යටතේ සිදුකළ වරදකට අදාල දඬුවම් මොනවාද ?
- ✱ අදාල දේපලේ වටිනාකම සහ එහි තුන්ගුණය අතර ප්‍රමාණයේ දඩයක් හෝ
- ✱ වසර 5 - 20 අතර ප්‍රමාණයේ බන්ධනාගාර ගත කිරීමක් හෝ
- ✱ ඉහත දඬුවම් දෙකම

✱✱✱ මීට අමතරව, අදාල දේපල රාජසන්තක වීමටද යටත් වන්නේය.

1.5) මුදල් විශුද්ධිකරණය යටතේ වන ප්‍රධාන විත්තිවාචික මොනවාද ?

එකඟවීමේ විත්තිවාචිකය

අදාල බලධාරීන් වෙත නිසි ලෙස අනාවරණය කර ඇති විට සහ ඒ සඳහා කැමැත්ත ලබාගෙන ඇති විට

සාධාරණ හේතු විත්තිවාචිකය

අදාල බලධාරීන් වෙත නිසි ලෙස අනාවරණය කිරීමට අදහස් කළද, සාධාරණ හේතුවක් නිසා එසේ කළ නොහැකි වන අවස්ථාවක්

1.6) මෙම පනත යටතේ බලරහිත කිරීමේ නියෝගයක් යනු කුමක්ද ?
යම් අයෙකු මුදල් විශුද්ධිකරණයේ යෙදී සිටින බවට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු පවතින විටදී එම ක්‍රියාව සඳහා යොදාගත හැකි යම් ගිණුමකට, දේපළකට හෝ ආයෝජනයකට අදාල කවර හෝ ගනුදෙනු තහනම් කරන ආඥාවක් වේ. මෙම පනත යටතේ පොලිස් නිලධාරියෙකුට බලරහිත කිරීමේ ආඥාවක් නිකුත් කළ හැකිය.

1.7) බලරහිත කිරීමේ නියෝගයක ලක්ෂණ මොනවාද ?
බල රහිත කිරීමේ ආඥාවක් මහාධිකරණය විසින් තහවුරු කළ යුතුය.
මෙම ආඥාවක් සාමාන්‍යයෙන් දින 7 ක කාලයක් සඳහා වලංගුය. ( මහාධිකරණයක් විසින් දීර්ඝ කරනු නොලැබුවහොත් මිස ) බලරහිත කිරීමේ ආඥාවක් ක්‍රියාත්මකව පවතින තෙක් ගිණුමකට, දේපලකට හෝ ආයෝජනයකට අදාලව සිදුකරන් ලබන යම් ගනුදෙනුවක් බලරහිත වන්නේය.

1.8) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත අදාල වන්නේ කවුරුන් සඳහාද ?

- ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින යම් අයෙක්
- ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන සහ මෙරට සහ මෙරටින් පිට සංස්ථාගත කළ යම් ආයතනයක්
- ශ්‍රී ලංකාවේදී සිදුකරන යම් ක්‍රියාවක්

2.1) 2007 අංක 24 දරණ පරිඝනක අපරාධ පනතට අනුව පරිඝනක අපරාධ යනු මොනවාද ?
පනතේ පළමුවැනි කොටසේ පරිගණක අපරාධ ලෙස නිශ්චිතව දක්වා ලැයිස්තුගත කර ඇති වැරදි වේ.
පරිගණකයකට හෝ පරිගණකයකින් නීතිවිරෝධී ලෙස දත්ත අත්පත් කර ගැනීම. පරිගණක භාවිතයෙන් ජාතික ආර්ථිකය හෝ ජාතික ආරක්ෂාව යම් අනතුරකට භාජනය කිරීම, පරිගණකයකට යම් වෙනස්කමක් හෝ යම් අලාභයක් විය හැකි යම් ක්‍රියාවක් නීතිවිරෝධී ලෙස පරිගණකයකට ඉටු කිරීමට සැලැස්විම ( වෛරස් ), පරිගණකය මාර්ගයෙන් සපයනු ලබන සේවාවකට වෙනත් අයෙකුට ප්‍රවේශ වීමට හැකියාව ලබා දෙමින් නීත්‍යානුකූල බලයක් නොමැතිව තොරතුරු අනාවරණය කිරීම. පරිගණකයකට නීත්‍යානුකූල නොවන ප්‍රවේශයක් අත්පත් කර ගැනිම සඳහා හෝ යම් පරිගණකයක් තුල ගබඩා කර තිබෙන යම් තොරතුරු වලට ප්‍රවේශය ගැනීමේ අරමුණෙන් සිදුකරනු ලබන යම් ක්‍රියාවක් ආදී වශයෙන් වූ පනතේ ලැයිස්තුගත කර ඇති වරදක් සිදු කිරීම, සිදුකිරීමට තැත් කිරීම, අනුබල දීම හා කුමන්ත්‍රණය කිරීම

2.2) එම පනතේ ප්‍රධාන අරමුණු මොනවාද ?
පරිගණක අපරාධ හඳුනාගැනීම. ඒවා විමර්ශනය කිරීමේ ක්‍රමවේදයක් සැලසීම හා එවන් අපරාධ සිදුවීම වැලැක්වීම.

3.1) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනතේ අරමුණු මොනවාද ?

- බුද්ධිමය දේපල සඳහා නීති සෑදිම
- බුද්ධිමය දේපල පිළිබඳ අධ්‍යක්ෂක ජෙනරාල්වරයෙක් පත් කිරීම
- බුද්ධිමය දේපල නීතිය පිළිබඳ ( ලියාපදිංචිය සහ පාලනය වැනි කරුණු සම්බන්ධයෙන් ) කාර්යක්ෂම කාර්ය පටිපාටියක් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම.

3.2) මෙම පනත යටතේ විවිධ බුද්ධිමය දේපල වර්ග මොනවාද ?
ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු සහ වෙළඳ ලකුණු, වෙළඳ නාම, භූගෝලීය දර්ශක, සංයුක්ත පරිපථයන් සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ

3.3 ) මෙම පනත යටතේ ප්‍රකාශන අයිතියක් යන්න විස්තර කරන්න.
ශාස්ත්‍රීය, කලාත්මක සහ විද්‍යාත්මක කාර්‍යයන්හි නිර්මාණකරුවන්ට එකී නිර්මාණ සම්බන්ධයෙන් ඇති ආර්ථික සහ සදාචාරාත්මක අයිතීන් ප්‍රකාශන අයිතිය ලෙස හැඳින්වේ. ආරක්ෂිත කාර්‍යයන් ලෙස පනත මගින් දක්වා ඇති පහත කාර්යන් සඳහා ප්‍රකාශන අයිතිය හිමිවේ.
ව්‍යතිරේඛී අවස්ථාවන්ට යටත්ව ප්‍රකාශන අයිතියක්, කෘතිය මහජනයාට ඉදිරිපත් කල දිනයේ සිට කර්‍ය ටිපාටික අවශ්‍යතා රහිතව කර්තෘගේ ජවිත කාලය තුල සහ ඔහුගේ මරණයෙන් වසර 70 ක කාලයක් පුරා බලපැවැත්වේ.

පනත මගින් දක්වා ඇති ආරක්ෂිත කාර්‍යයන්

- පොත්, පත්‍රිකා, ලිපි, පරිඝනක වැඩසටහන් සහ වෙනත් ලියවිලි
- කථා, දේශන ඇමතීම්, අනුශාසනා සහ වෙනත් වචිත කෘති

➡ සංගීතය සමග ගයන වචන ඇතුලත් වන හෝ නොවන සංගීතමය කෘති
➡ ශ්‍රව්‍ය, දෘශ්‍ය කෘති
➡ ගෘහ නිර්මාණ ශිල්පීය කෘති
➡ කෘතිවල පරිවර්ත, අනුර්තන, එකලස් කරීම් සහ වෙනත් විපර්යාසයන් සහ විකරණයන් ආදිය ඇතුලු තවත් දේ.

3.4) මෙම පනත යටතේ පේටන්ට් බලපත්‍රයක් සහ ලකුණක් යනු මොනවාදැයි විස්තර කරන්න.
පේටන්ට් බලපත්‍රයක් යනු යම් තැනැත්තෙකුට නව නිපැයුමක්, එහි නව නිපැයුම්කාරී පියවරක් තිබේ නම් සහ එය කාර්මික වශයෙන් යොදාගත හැකිනම් ඊට අදාල නිශ්චිත, විශේෂිත, අනන්‍ය අයිතිවාසිකම් ලබාගත හැකි බලපත්‍රයකි.
පේටන්ට් බලපත්‍රයක්, එය ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත ගොනුකළ දිනයේ සිට වසර 20 ක කාලයකට වලංගු වේ.
බුද්ධිමය දේපල පනතට අනුව ලකුණක් යන්නට, වෙළඳ ලකුණක් හෝ සේවා ලකුණක් අයත් වේ. වෙළඳ ලකුණක් ( Trade Mark ) යනු එක් ව්‍යවසායක භාණ්ඩයක්, තවත් ව්‍යවසායක භාණ්ඩයකින් වෙන්කොට දැක්වීම පිණිස යොදාගන්නා දෘශ්‍යමාන ලාංඡනයකි. සේවා ලකුණක් යනු එක් ව්‍යවසායක සේවයක් තවත් ව්‍යවසායක සේවයකින් වෙන්කර දැක්වීම පිණිස උපයෝගී කරගනු ලබන යම්කිසි දෘශ්‍යමාන ලාංඡනයකි.
උදා - මිහින් ලංකා
වෙලඳ ලකුණක් ලියාපදිංචි කිරීමෙන් පසු වසර 10 ක කාලයක් සඳහා වලංගු වන අතර එහි ලියාපදිංචිය නැවත නැවතත් අලුත් කල හැකිය.

3.5) මෙම පනත යටතේ කාර්මික සැලසුමක් යනු කුමක්ද ?
කාර්මික හෝ හස්ත කර්මාන්ත නිෂ්පාදනයකට මෝස්තරයක් ලෙස උපයෝගී කරගත හැකි යම් රේඛා පිළිබඳ හෝ වර්ණ පිළිබඳ ත්‍රිමාණ ආකෘතියක් කාර්මික සැලසුමක් නම් වේ.මෙය ලියාපදිංචි කිරීමේ අරමුණ නම් එවන් කාර්මික සැලසුමක් කෙරෙහි තම හිමිකම අනන්‍ය වශයෙන් ලබා ගැනීමයි. මෙවන් කාර්මික සැලසුමක් පනත යටතේ ලියාපදිංචි කිරීමේදී එය කාර්මික ලේඛණය නම් ලේඛණයක සටහන් කරයි. මෙය ඕනෑම කෙනෙකුට පරීක්ෂා කර බැලිය හැකි ලේඛණයකි. ආදාල ලියාපදිංචි ඉල්ලුම්පත ලද දින සිට වසර 5 කට වලංගුය. කර්තෘගේ මනාපය මත මෙම කාල සීමාව තවත් අනුගාමී වසර පහක කාලසීමා දෙකකට දීර්ඝ කළ හැකිය.

4.1) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවන ලද්දේ කිනම් නීතියක් යටතේද ?

2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු අධිකාරිය පිලිබඳ පනත

4.2) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පිහිටුවීමේ අරමුණු මොනවාද ?

✸ පාරිභෝගිකයන්ගේ ජවිත වලට සහ දේපල වලට හානි සිදුවන භාණ්ඩ හෝ සේවා ප්‍රවර්ධනයෙන් පරිභෝගිකයන් ආරක්ෂා කිරීම

✸ අසාධාරණ වෙලඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් නිසි අවධානය ලබාදීම

✸ අසාධාරණ වෙලඳ පරිචයන්ට එරෙහිව, තහනම් කරන ලද වෙලඳ පරිචයන්ට එරෙහිව හෝ පාරිභෝගිකයා සූරාකෑමට ලක් කරන ඕනෑම වෙලඳ පරිචයකට එරෙහිව කටයුතු කර අලාභ / හානි අය කර ගැනීම

4.3) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ බලතල මොනවාද ?

✖ තහනම් කරන ලද වෙලඳ පරිචයන් පාලනය කිරීම සහ සහමුලින්ම අවසන් කරීම

✖ මිල පාලනය කිරීම

✖ භාණ්ඩ වල සහ සේවා වල ප්‍රමිතිය, ප්‍රමාණය, ශක්‍යතාවය, පිරිසිදු බව, මිනුම් දර්ශක සහ මිල පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීම

✖ තරඟකාරීත්වයට එරෙහි පරිචයන් සහ ඒකාධිකාරී බලය අයුතු ලෙස භාවිතා කිරීම විමර්ශනය කිරීම හෝ ප්‍රශ්ණ කිරීම

✖භාණ්ඩ සහ සේවා සපයන්නන් අතර පලදායී තරඟකාරීත්වයක් පවත්වාගෙන යාම සහ ඊට අනුග්‍රහය දැක්වීම

✖ පනතේ දක්වා ඇති කරුණු පිළිබඳව ගැටලු විමර්ශනය කිරීම

ආදී පනත මගින් දක්වා ඇති කාර්යන්.

4.4) මෙම පනත යටතේ වන ප්‍රධාන වැරදි කිහිපයක් නම් කරන්න.

4.5) මෙම පනත යටතේ වෙළඳුන් හට ඇති වගකීම් මොනවාද ?

5.1) 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතෙහි ප්‍රධාන අරමුණු මොනවාද ?

- ✱ ඉලෙක්ට්‍රොනික ගිවිසුම් පිලිගැනිම සහ පහසුකම් සැපයිම
- ✱ ඉලෙක්ට්‍රොනික පණිවිඩ ලේඛණ හා සන්නිවේදන පිලිගැනීම් නිර්මාණය සහ හුවමාරුව
- ✱ සහතික කිරීමේ බලාධිකාරයක් පත් කිරීම
- ✱ සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් පිලිගැනීම / බලය ලබා දීම.

5.2) එම පනත අදාල නොවන අවස්ථා මොනවාද ?
✖ විනිමය බිල්පත් ආඥාපනත යටතේ අර්ථකථනය කර ඇති විනිමය බිලක් සම්බන්ධයෙන්
✖ ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත යටතේ වන ඇටෝර්නි බලපත්‍රයක් සම්බන්ධයෙන්
✖ විදුලි සංදේශ පනත යටතේ නිකුත් කරන ලද විදුලි සංදේශ පද්ධතියක් සඳහා වූ බලපත්‍රයකට
✖ නිශ්චල දේපලක් හෝ එම දේපලට ඇති සම්බන්ධතාවයන් විකිණීම හෝ පවරා දීම සඳහා වූ ගිවිසුමක් සඳහා
✖ අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීම හෝ ක්‍රියාත්මක කිරීම හෝ කවර නාමයකින් හැඳින්වෙන වෙනත් යම් තෙස්තමේන්තුවකට
✖ මෙම පනත යටතේ ඇමතිවරයා විසින් සාදනු ලබන නියෝගයක් නිශ්චය කොට දැක්වෙන වෙනත් යම් ලියවිල්ලකට, ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට

5.3) මෙම පනතට අනුව ඉලෙක්ට්‍රොනික ලේඛණයක් නීතිය ඉදිරියේ පිලිගැනීම සඳහා තිබිය යුතු අවශ්‍යතා ?
● දත්ත ජනනය හා ගමනාන්තය හඳුනාගත හැකි විය යුතුය.
● ඉලෙක්ට්‍රෙනික ලේඛණ වල අඩංගු කරුණු වල අවංකභාවය පිලිබඳව සාධාරණ සහතිකයක් තිබිය යුතුය.
● ඉලෙක්ට්‍රොනික ලේඛණය, එය ජනනය වූ ආකෘතියෙන්ම හෝ ජනනය වූ තොරතුරු නිවැරදිව ඉදිරිපත් වෙන පරිදි දැක්වීමට හැකි ආකෘතියක හෝ සුරක්ෂිතව රඳවා තැබිය යුතුය.
● එය පසු අවස්ථාවකදී ප්‍රවේශය වීම සඳහා හැකි විය යුතුය.
● එම ලේඛණයේ ඉලෙක්ට්‍රොනික අත්සනක් තිබිය යුතුය.

● <u>ඉලෙක්ට්‍රොනික අත්සන යනු,</u> ඉලෙක්ට්‍රොනික ලේඛණයක් සහතික කිරීමේ අරමුණින් එම ලේඛණය සමග තාර්කිකව සම්බන්ධ වන ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ යම් අක්ෂරයන්, අංක, රූප, සංකේත අක්ෂර හෝ මේවායේ සංයෝජනයකි.
● <u>ඉලෙක්ට්‍රොනික ගිවිසුමක් යනු</u> අර්පනය සහ ප්‍රතිග්‍රහණය ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් වන අවස්ථාවකදී ඇතිවන නෛතිකව වලංගු ගිවිසුමකි.

● ඉලෙක්ට්‍රොනික සංනිවේදනය යනු මූලාරම්භක විසින්, ලිපිනය හිමිකරු වෙත ස්වයංක්‍රීය සන්නිවේදන පද්ධතියක් මගින් යවනු ලබන සන්නිවේදනයකි.

● මූලාරම්භක යනු සන්නිවේදනය යවනු ලබන හෝ උත්පාදනය කරනු ලබන තැනැත්තාය. එම අර්ථයට වෙනත් අයෙකු වෙනුවෙන් එම සන්නිවේදනය යවනු ලබන හෝ උත්පාදනය කරනු ලබන යම් තැනැත්තෙකුද ඇතුලත් වේ.

● ලිපිනය හිමිකරු යනු සන්නිවේදනයක් ප්‍රතිග්‍රහණය කිරීමට එහි මූලාරම්භක විසින් අරමුණු කළ තැනැත්තා වේ.

🖊 ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් යැවීම සිදුවන්නේ මූලාරම්භකගේ පාලනයෙන් බාහිරව වූ තොරතුරු පද්ධතියකට එම සන්නිවේදනය ඇතුලත් වූ විට හෝ එම සන්නිවේදනය මූලාරම්භකගේ පාලනයෙන් බාහිර වූ තොරතුරු පද්ධතියකින් නික්ම නොයන්නේ නම්, මෙම සන්නිවේදනය ලිපිනය හිමිකරු වෙත ලැබෙන අවස්ථාවකදීය.

🖊 මූලාරම්භකගේ සන්නිවේදනය ලද බව ලිපිනය හිමිකරු විසින් දැනුම් දිය යුතු බව ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක මූලාරම්භක විසින් නියම කර ඇති අවස්ථාවකදී, ලිපිනය හිමිකරු විසින් ඒ බව දැනුම්දීමක් නොකරන්නේ නම්. එම සන්නිවේදනය මූලාරම්භක විසින් කිසිසේත්ම ලිපිනය හිමිකරුවෙක් වෙත යවා නොමැති සේ සැලකේ.

**☛ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් ලැබුණු වේලාව නිර්ණය කිරීම**

⊗ එය ප්‍රතිග්‍රහනය සඳහා ලිපිනය හිමිකරු විසින් යම් තොරතුරු පද්ධතියක් නම් කර ඇත්නම්,එම සන්නිවේදන පද්ධතියට අදාල සන්නිවේදනය ඇතුලත් වූ වේලාවයි.

⊗ ඉහත පරිදි නම් කර නැතිනම්, එම සන්නිවේදනය, ලිපිනය හිමිකරුගේ තොරතුරු පද්ධතියට අදාල සන්නිවේදනය ඇතුලත් වූ වේලාවයි.

⊗ ලිපිනය හිමිකරු විසින් නම් කළ තොරතුරු පද්ධතියක් නොවන වෙනත් තොරතුරු පද්ධතියක් මගින් එම සන්නිවේදනය ප්‍රතිග්‍රහණය කරනු ලැබුවහොත්, ලිපිනය හිමිකරු විසින් එය ප්‍රතිග්‍රහණය කරනු ලැබූ වේලාවයි.

⊗ සහතික කිරීමේ සේවයක් යනු ඉලෙක්ට්‍රොනික ස්වරූපයෙන් තොරතුරු යවන්නන්ට හෝ ලබන්නන්ට හෝ යම් තොරතුරක් එහි රහස්‍යභාවය ආරක්ෂා කිරීම තහවුරු කිරීම ගබඩා කරනු ලබන්නට පහසුකම් සපයන ලබන යම් සේවාවකි.

5.4) මෙම පනත යටතේ සහතික කිරීමේ බලාධිකාරියේ බලතල මොනවාද ?

**ꕥ** අභියාචනා තීරණය කිරීම සහ අභියාචනා තීරණය කිරීම සඳහා වන කාර්ය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම.

**ꕥ** සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීම හෝ වෙනත් යම් ආකාරයක බලයක් ලබා දීම.

**ꕥ** සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන් විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු බවට නියම කරනු ලබන වාර්තා සහ ලේඛණ පවත්වා ගන්නා ලෙස නියම කිරීම.

**ꕥ** සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීම.

**ꕥ** සහතික කිරීමේ සේවා සැපයුම්කරුවන්ට විධාන නිකුත් කිරීම.